සැ. යු. - 2012.04.27 දින පළ වූ අංක 1,756 දරන ගැසට් පත්‍රයේ I – III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,757 - 2012 මැයි මස 04 වැනි සිකුරාදා - 2012.05.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 610 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 611 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 614 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 614 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 619 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මැයි මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අප්‍රේල් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ පාලම් තට්ටු අලුත්වැඩියා කිරීම සඳහා ද්‍රව්‍ය මිල දී ගැනීම පිළිබඳ ප්‍රසම්පාදනය**

01. ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය මූලස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපතිතැන විසින් පහත සඳහන් අයිතම මිලදී ගැනීම සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

| *අයිතමය* | *විස්තරය* | *දිග* | *අවශ්‍ය ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | M. S. U. Beams – HEB 500 x 187 kg./m | 10 M | 32 |
| 2 | M. S. U. Beams – HEB 340 x 134 kg./m | 10 M | 16 |
| 3 | M. S. Angles – 150 x 150 x 16 mm | 06 M | 14 |

ලංසුකරුවන් ලංසු සෘජුවම හෝ ඇටෝර්නි බලය පවරන ලද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බලයලත් නියෝජිතයින් මගින් ඉදිරිපත් කළ හැක.

02. ආපසු නොගෙවන ශ්‍රී ලංකා රු. 3,000ක් හෝ පහසුවෙන් පරිවර්තනය කළ හැකි සමාන මුදලක් ගෙවා, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වලින් 2012.05.23 දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 3.00 ට දක්වා ලබාගන්නා ආකෘති පත්‍රවල පමණක් සටහන් කළ ලංසු ඉදිරිපත් කළ යුතු යි.

03. 2012.05.25 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලැබේ.

04. ISO 9001 : 2000/BS EN ISO 9001 : 2002 සහතික ලත් සමාගම් විසින් පමණක් හෝ මිලදී ගන්නාට පිළිගත හැකි ඒ සමාන සම්මත ජාත්‍යන්තර තත්ත්ව කළමනාකරණ පද්ධතියකින් පිළිගත් සමාගම් පමණක් මෙම අයිතම නිෂ්පාදනය හා සැපයුම් සිදුකළ යුතුයි.

05. ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවා මූලස්ථානයේ දී, ලංසු භාරගැනීම අවසන් කළ වහාම ඒවා විවෘත කරනු ඇත. මෙම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

06. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට හෝ අතින් රැගෙන විත් භාරදිය හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
දුම්රිය මූලස්ථානය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කට් මාවත, කොළඹ 10
ශ්‍රී ලංකාව යන ලිපිනයට

07. ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයේ දී අයකිරීමකින් තොරව ලංසු ලියවිලි පරීක්ෂාකර බැලිය හැකි අතර වැඩිමනත් විස්තර සඳහා පහත ලිපිනය අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි තැන,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කට් මාවත, කොළඹ 10
ශ්‍රී ලංකාව.
දුරකථන අංක : 94 (11) 2432044
හෝ
94(11) 2436818.

සභාපති තැන,
දෙපාර්තමේන්තු ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

05-57

---

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීම

2012/2014 වර්ෂය සඳහා රේගු පත්‍රිකා පිළියෙල කිරීම සකස් කිරීම රේගු සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ලිපිලේඛන ඉදිරිපත් කිරීම දුම්රිය සඳහා වූ භාණ්ඩ කොළඹ වරායෙන් සහ කටුනායක, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙන් නිශ්කාශනය කිරීම සහ මරදාන/රාගම/රත්මලාන දෙමටගොඩ දුම්රිය ගබඩා වෙත ගෙනැවිත් භාරදීම සඳහා ප්‍රසම්පාදනය කිරීම.

01. සභාපති, කොළඹ 10, ඕල්කට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවය (ප්‍රධාන) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින්, සටහන් සකස් කිරීම, රේගු හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ලියකියවිලි, පරිහරණය කිරීම දුම්රිය භාණ්ඩ නිශ්කාශනය කිරීම භාණ්ඩ ගෙනැවිත් භාරදීම ඇතුළු වාප්පු කටයුතු පිළිබඳව වසර 10කට වැඩි පළපුරුද්ද සහිත කොන්ත්‍රාත්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. 2012.05.11 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලැබේ.

03. කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි වෙතින් ආපසු නොගෙවන රු. 3,000 (රුපියල් තුන්දහසක) ලිපිලේඛන ගාස්තුවක් ගෙවීම මත 2012.05.09 වැනි දින ප. ව. 3.00 දක්වා ලබාගත හැකි ආකෘති පත්‍ර මත පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාරගැනීම අවසන්වීමත් සමගම, කොළඹ 10, ඕල්කට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය මූලස්ථානයේ දී, ලංසු විවෘත කිරීම සිදු කෙරේ. ලංසු විවෘත කිරීමේ අවස්ථාවට ලංසු තබන්නන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්හට සහභාගිවීමට පුළුවන.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ යුත්තේ,

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10

06. ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේ දී ගෙවීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂාකර බැලිය හැකි අතර, වැඩිදුර විස්තර සඳහා සම්බන්ධ විය යුත්තේ,

දුම්රිය ගබඩා අධිකාරි,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2432044 හෝ 2436818.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F6915.

05-58

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - අනුරාධපුර

### ප්‍රසිද්ධ භාණ්ඩ වෙන්දේසිය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලබූ, හිමිකම් නොපාන ලද නඩු අංක මැකී ඇති නඩු වාර්තා සොයා ගැනීමට අපහසු, නඩු අංක සොයා ගැනීමට අපහසු භාණ්ඩවල අංක මැකී ඇති පහත සඳහන් භාණ්ඩ 2012.05.18 වැනි දින ප. ව. 2.30 ට අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන්නේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනයට පෙර හෝ එදින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇති ව වෙන්දේසි දින නියමිත වේලාවට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව පිළි නොගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එවෙලේ ම මුදල් ගෙවා ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු බවත්, සියලුම ගෙවීම් මුදලකින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා ගැණුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරි අවසන් වීමට පෙර අධිකරණය වෙත දැන්විය යුතු අතර, ඊට පසුව ලැබෙන පැමිණිලි භාරගනු නොලැබේ.

08. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව ද වැඩි දුරටත් සඳහන් කරමි.

පී. එන්. ආර්. මාරපන,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
අනුරාධපුරය.

2012 අප්‍රේල් මස 10 වැනි දින,
අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | බී 2165/11 | උදලු 01 |
| | | පිකස් 01 |
| | | අලවංගු 01 |
| | | ප්ලාස්ටික් බාල්දි 01 |
| | | අඩි 20ක් දිග කඹ 01 |
| | | උණු වතුර බෝතල් 01 |
| | | විදුලි පන්දම් 03 |
| 02. | බී 2799/10 | අඩි 04ක් පමණ උස ඔක්සිජන් සිලින්ඩර් 01 |
| | | කාබට් ටැංකි 01 |
| | | යාර 10ක් පමණ වෑල්ඩින් බට 01 |
| | | නිපල් 04ක් සහිත ලාම්පු 01 |
| 03. | 5136 | පොරව 01 |
| 04. | 90008 | කැති 01 |
| 05. | 91000 | කැති 01 |
| 06. | 90611 | කැති 01 |
| 07. | 90009 | කැති 01 |
| 08. | 90007 | කැති 01 |
| 09. | 9467 | කැති 01 |
| 10. | 9856 | කැති 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 11. | 9465 | කැති 01 |
| 12. | 9176 | කැති 01 |
| 13. | 4668 | කැති 01 |
| 14. | 3111 | කැති 01 |
| 15. | 3110 | කැති 01 |
| 16. | 5134 | කැති 01 |
| 17. | 10818 | කැති 01 |
| 18. | 10813 | කැති 01 |
| 19. | 7326 | පොරව 01 |
| 20. | 16249 | බාල්දි 01 (යකඩ) |
| 21. | 16248 | ප්ලාස්ටික් බාල්දි 01 |
| 22. | 16246 | සවල් 01 |
| 23. | 16247 | ප්ලාස්ටික් බාල්දි 01 |
| 24. | 12240 | ජල කරාමයක් |
| 25. | බී 2561/10 | රේක්ක 01 |
| 26. | 12892 | 50 ග්‍රෑම් දුනු තරාදි 01 |
| 27. | 12883 | වක් කැති 01 |
| 28. | 12909 | ගණක යන්ත්‍ර 01 |
| 29. | 9168 | අත් කියත් 01 |
| | | කියත් 01 |
| | | දග කොටු 01 |
| | | වරක්කල 01 |
| 30. | 87068 | කැති 01 |
| 31. | 87077 | කැති 01 |
| 32. | 87082 | කැති 01 |
| 33. | 89513 | කැති 01 |
| 34. | 89511 | කැති 01 |
| 35. | 89510 | කැති 01 |
| 36. | 7911 | පොරව 01 |
| 37. | 9175 | කැති 01 |
| 38. | 86473 | කුලු ගෙඩි 01 |
| 39. | 94979 | කැති 01 |
| 40. | 94980 | කැති 01 |
| 41. | 98672 | කැති 01 |
| 42. | 4676 | කැති 01 |
| 43. | 4679 | කැති 01 |
| 44. | 7324 | කැති 01 |
| 45. | 7327 | සවල් 01 |
| 46. | 7328 | සවල් 01 |
| 47. | 7329 | කැති 01 |
| 48. | 11625 | උදලු 01 |
| 49. | 11626 | කැති 01 |
| 50. | 11627 | කැති 01 |
| 51. | 9171 | කැති 01 |
| 52. | 9172 | කැති 01 |
| 53. | 9173 | පොරව 01 |
| 54. | 9174 | පොරව 01 |
| 55. | 9855 | පොරව 01 |
| 56. | 10612 | උදලු 01 |
| 57. | 10609 | කැති 01 |
| 58. | 10608 | කැති 01 |
| 59. | 10606 | කැති 01 |
| 60. | 13600 | පොරව 01 |
| 61. | 15204 | චාජර් 01 |
| 62. | 19371 | පාවහන් යුගල 01 |
| 63. | 15385 | චාජර් 01 |
| 64. | 15378 | ඔයිල් 250 මි. ලී. |
| 65. | 15381 | එන්. ජී. කේ. ප්ලග් 01 |
| 66. | 15382 | චාජර් 01 |
| 67. | 16194 | පාවහන් යුගල 01 |
| 68. | 16208 | චාජර් 01 |
| 69. | 16204 | පාට පැන්සල් 10 |
| 70. | 16187 | ජල කරාම 01 |
| 71. | 16220 | කැති 01 |
| 72. | 16221 | කැති 01 |
| 73. | 15916 | වයර් මීටර් 21 |
| | | බල්බ් 01, වෝල්ට් 100 |
| | | හෝල්ඩර් 01 |
| 74. | 15915 | වයර් මීටර් 110 |
| | | එස්. ඒ. ප්ලග් 01 |
| 75. | 15914 | වයර් මීටර් 08 |
| | | එස්. ඒ. ප්ලග් 01 |
| | | වයර් මීටර් 05 |
| 76. | 16554 | රීටෙල් දුරකථන 01 |
| 77. | 90627 | කැති 01 |
| 78. | 90629 | සවල් 01 |
| 79. | 90630 | සවල් 01 |
| 80. | 90628 | කැති 01 |
| 81. | 10611 | පොරව 01 |
| 82. | 17071 | චාජර් 01 |
| 83. | 17069 | ජල කරාමයක් |
| 84. | 17664 | සවල් 02 |
| | | බාල්දි 01 |
| 85. | 18094 | පාවහන් යුගල 01 |
| 86. | 18111 | ළදරු ඇඳුම් 01 |
| 87. | 18101 | පර්ස් 01 |
| 88. | 14443 | ලී ඉරුම් බංකු 01 |
| 89. | 18466 | ලීටර් 01 මිනුමක් |
| 90. | 19643 | වයර් මීටර් 30 |
| | | හෝල්ඩර් 01 |
| | | බල්බ් 01 |
| 91. | 19642 | වයර් මීටර් 50 |
| | | වයර් මීටර් 40 |
| | | බල්බ් 03 |
| | | හෝල්ඩර් 08 |
| 92. | 20523 | කරාබු ජෝඩු 01 |
| 93. | 20527 | කරාබු ජෝඩු 01 |
| 94. | 20533 | කරාබු ජෝඩු 01 |
| 95. | 25539 | කරාබු ජෝඩු 01 |
| 96. | 16585 | කියත් 01 |
| 97. | 20817 | ජල කරාම 01 |
| 98. | 20821 | බල්බ් 01 |
| 99. | 21080 | ඇලුමිනියම් කළ 01 |
| 100. | 18674 | සවල් 01 |
| | | බාල්දි 01 |
| 101. | 21547 | දුරකථන 01 |
| 102. | 21696 | කැති 01 |
| 103. | 22080 | කැති 01 |
| 104. | 22081 | කැති 01 |
| 105. | 22082 | කැති 01 |
| 106. | 23264 | දුරකථන 01 |
| 107. | 22546 | හෝල්ඩර් 01 |
| 108. | 22545 | වයර් මීටර් 05 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| | | බ්‍රේකර් 01 |
| | | ප්ලග් බේස් 01 |
| | | ප්ලග් 01 |
| 109. | 21900 | හෝල්ඩර් 01 |
| | | බල්බ් 01 |
| 110. | ඒ. 1859/11 | යකඩ බට 04 |
| | | යකඩ බට 29 |
| 111. | 3940 | දුරකථන 01 |
| 112. | 4050 | සවල් 01 |
| 113. | 4051 | උදලු 01 |
| 114. | 4052 | සවල් 01 |
| 115. | ඒ. 2245/10 | අරුන්ගල් 02 |
| 116. | 6143 | කැති 01 |
| 117. | 6125 | කැති 01 |
| 118. | 8947 | සවල් 01 |
| 119. | 8948 | සවල් 01 |
| 120. | 8949 | සවල් 01 |
| 121. | 8950 | බාල්දි 01 |
| 122. | 9674 | දුරකථන 01, සිම් 01, මෙමරි චිප් 01 |
| 123. | ඒ 3171/10 | 4 ටී 230 වතුර මැෂින් 01 |
| 124. | 16584 | සවල් 01 |
| 125. | 17049 | සවල් 01 |
| 126. | 17337 | වයර් මීටර් 55 |
| | | වෝල්ට් 100 බිලබ් 01 |
| | | හෝල්ඩර් 01 |
| 127. | 17262 | ඊටෙල් දුරකථන 01 |
| 128. | 18116 | සවල් 01 |
| 129. | 14042 | වයර් මීටර් 250 |
| | | බල්බ් 01 |
| | | හෝල්ඩර් 01 |
| 130. | 19227 | බාල්දි 01 |
| 131. | 18906 | පොරව 01 |
| 132. | 19593 | තංගුස් දැල් 01 |
| 133. | 19594 | තංගුස් දැල් 01 |
| 134. | 19595 | තංගුස් දැල් 01 |
| 135. | 20450 | වයර් මීටර් 05 |
| | | බල්බ් 01 |
| 136. | 20879 | සවල් 01 |
| 137. | 21246 | වයර් මීටර් 27 |
| | | මල්ටි ප්ලග් 01 |
| | | ප්ලග් ටොප් 01 |
| | | ප්ලග් ටොප් 01 |
| 138. | 21484 | වයර් මීටර් 100 |
| | | ප්ලග් ටොප් 01 |
| 139. | 22059 | බාල්දි 01 |
| 140. | 21681 | සවල් 01 |
| 141. | 21680 | කැති 01 |
| 142. | 21682 | සවල් 01 |
| 143. | 20804 | කැති 01 |
| 144. | 21340 | උදලු 01 |
| 145. | 22058 | සවල් 01 |
| 146. | බී 1521/09 | දුරකථන 01 |
| 147. | 23056 | උදලු 01 |
| 148. | 23263 | උදලු 01 |
| 149. | 23262 | සවල් 01 |
| 150. | 23261 | සවල් 01 |
| 151. | 23264 | ජංගම දුරකථන 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 152. | 22545 | ට්‍රේකර් පිලග් බේස් 01 |
| | | ප්ලග් වයර් මීටර් 19 |
| | | හෝල්ඩර් 01 |
| 153. | 22546 | බල්බ් 01 |
| 154. | ඒ 1859/11 | යකඩ බට 33 |
| 155. | 23461 | මිලි මීටර් 16 වයර් මීටර් 12 |
| | | මිලි මීටර් 16 වයර් මීටර් 02 |
| 156. | ඒ 2065/11 | උදලු 02 |
| | | අඩි 03 පමණ යකඩ කුරු 02 |
| | | අඩි 55 දිග වයර් 01 |
| | | හෝල්ඩර් 01 |
| | | වෝල්ට් 100 බල්බ් 01 |
| | | රතු කළු විදුලි පන්දම් 01 |
| 157. | 24925 | නොකියා දුරකථන 02 |
| 158. | ඒ 1688/11 | සවල් 01, ටියුඩ් 01 |
| 159. | ඒ. 2159/11 | විදුලි පන්දම් 01 |
| 160. | ඒ 1954/11 | පිත්තල පාට මාලිමා 01, මේස පිහි 01 |
| | | කලු පාට විදුලි පන්දම් 01 (කුඩා) |
| 161. | 25289 | සවල් 01 |
| 162. | 25551 | නොකියා දුරකථන 01 |
| 163. | 26287 | යකඩ බට කුඩා 05 |
| 164. | 25261 | බල්බ් 01, වයර් මීටර් 40 |
| 165. | 26020 | ලී ඉරුම් කඳ 01 |
| 166. | 21547 | ජංගම දුරකථන 01 |
| 167. | 23153 | ජල කරාම 01 |
| 168. | 23373 | කැති 01 |
| 169. | 23372 | කැති 01 |
| 170. | 23367 | කැති 01 |
| 171. | 23370 | කැති 01 |
| 172. | 94104 | පොරව 01 |
| 173. | 9464 | කැති 01 |
| 174. | 22057 | කැති 01 |
| 175. | 12245 | කැති 01 |
| 176. | 10819 | කැති 01 |
| 177. | 19926 | කැති 01 |
| 178. | 12246 | කැති 01 |
| 179. | 18904 | කැති 01 |
| 180. | 21339 | කැති 01 |
| 181. | 23144 | කැති 01 |
| 182. | 23145 | කැති 01 |
| 183. | 23147 | කැති 01 |
| 184. | 23148 | කැති 01 |
| 185. | 23384 | බෑග් 01 |
| 186. | 73561 | කරාම 01 |
| 187. | 23563 | අංක 90, වැලිකඩදාසි 01 |
| 188. | 25867 | දුරකථන 01 |
| 189. | 26179 | චාජර් 01 |
| 190. | 26177 | චාජර් 01 |
| 191. | 26178 | චාජර් 01 |
| 192. | 26180 | චාජර් 01 |
| 193. | 26189 | චානේ කම්බි 01 මී. 07 |
| 194. | 26195 | සිසිල් ෆිල්ටර් 01 |
| 195. | 26624 | පැඩල් 01 |
| 196. | 28357 | කරාම 01 |
| 197. | 26020 | ලී ඉරුම් යතු 01 |
| 198. | 14443 | ලී ඉරුම් යතු 01 |

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**2012 ජූලි මස 01 වැනි දින සිට 2013 ජුනි මස 30 වැනි දින දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම**

නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2012 ජූලි මස 01 වැනි දින සිට 2013 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම, ඕනෑම මහලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% ට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක...................... දරන.......................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2012.05.31 දින පෙ.ව. 10.00 ට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2012.05.31 වැනි දින පෙ.ව. 10.00 ට ටෙන්ඩර්පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් නාත්තන්ඩිය ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2012.06.14 දින පෙ.ව. 10.00 ට සිදු කරනු ලැබේ.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

එන්. ඒ. ඒ. පී. එස්. නිස්සංක,
ප්‍රාදේශීය ලේකම්,
නාත්තන්ඩිය.

*උපලේඛනය*

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|
| 01 | නාත්තන්ඩිය | මුදුකටුව | රු. 1,000 |
| 02 | නාත්තන්ඩිය | කටුනේරිය | රු. 1,000 |

05-37

# රජයේ නොවන දැන්වීම්

**විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ශ්‍රී ලංකාවේ, හොරණ, ග්‍රේස්ලන්ඩ් වත්ත, අංක 193/104 දරන ස්ථානයේ පදිංචි කළුබෝවිලගේ දෝන ඉන්ද්‍රානි වන මා විසින් 2002.11.28 වැනි දින කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර පාර, බණ්ඩාරගම, "රෝහණ" හි පදිංචි සුගතපාල වීරසිංහ, ප්‍රසිද්ධ නොතාරිස් තැන ලවා ලියා සහතික කරන ලද 2004.10.25 දිනැති ඇටෝර්නි බලපත්‍ර පොතේ 288 කාණ්ඩයේ 33 පත් ඉරුවේ 13868 දින පොත් අංකය යටතේ ලියාපදිංචි කර ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් හොරණ, ග්‍රේස්ලන්ඩ් වත්ත, අංක 193/104 දරන ස්ථානයේ පදිංචි කළුබෝවිලගේ දොන් මහින්දරත්න යන අය මගේ විශේෂ ඇටෝර්නි බලකරු වශයෙන් කර තිබූ පත්වීම, මෙතැන් සිට මා විසින් බලරහිත කොට අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

කළුබෝවිලගේ දෝන ඉන්ද්‍රානි.

2011 දෙසැම්බර් මස 30 වැනි දින.

05-01

**නිවේදනයයි**

වර්ෂ 2007, අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටින්නෙමු :-

සමාගමේ නම : සිස්ටම් ඩී ස්විලුප්පො ලිමිටඩ්
සමාගම් අංකය : පී බී 5012
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 7/1, ජාවත්ත ඇවනිව්, කොළඹ 5
සංස්ථාගත කළ දිනය : 2012 මාර්තු 30.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පී. වී. ටී.) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-05

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී :-

සමාගමේ නම : කොමර්ෂල් මල්ටි ලංකා ඩිවොලොප්මන්ට් එල් ටී ඩී
සමාගමේ අංකය : පී බී 5010
ලියාපදිංචි කළ දිනය : 2012.03.29
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 75, ඕළුගන්තොට, බොරලන්ද, වැලිමඩ.

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

05-08/1

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී :-

සමාගමේ නම : යුනිටි මයික්‍රෝ ෆිනෑන්ස් සර්විස් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ අංකය : පී වී 80333
ලියාපදිංචි කළ දිනය : 2011.07.28
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : පොලිස් නිවාස පාර, අම්පාර.

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

05-08/2

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි:-

සමාගමේ නම : වෙන්ච ෆස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : 85371
සංස්ථාගත කළ දිනය : 2012 අප්‍රේල් 04 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 56/1, ධර්මපාල මාවත, මාදිවෙල, කෝට්ටේ.

අධ්‍යක්ෂ.

05-11

---

## දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි:-

1. සමාගමේ නම : සීක්‍රට් ගාඩ්න් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2012 අප්‍රේල් 03
3. සමාගමේ අංකය : පී වී 85292
4. ලියාපදිංචි ලිපිනය : අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර, කොළඹ 04.

එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට් ලිමිටඩ්),
ලේකම්.

අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

05-13

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 06, ලෙයාර්ඩ්ස් පාරේ, අංක 25/1 හි පදිංචි කුසුමාවතී සිරිසේන වන මා විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වයි. වී. ආර්. බාලසූරිය විසින් සහතික කරන ලද අංක 2256 සහ 2008ක් වූ ජූලි මස 26 වැනි දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් කොළඹ 07, මල් පාර, අංක 15 හි පදිංචි ජයන්ත නිශ්ශංක සිරිසේන නොහොත් මලගලගේ දොන් ජයන්ත නිශ්ශංක සිරිසේන වෙත බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2012 ක් වූ අප්‍රේල් මස 17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන බවට ශ්‍රී ලංකා රජයටත් , මහජනතාවටත් මින් දැනුම් දෙනු ලැබේ.

05-16

---

## සංස්ථාගත කිරීමේ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නාමය : එච් ඇන්ඩ් එම් ෂිපින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 84476
සංස්ථාපිත දිනය : 2012 පෙබරවාරි 23
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 36, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච් ඇන්ඩ් එම් ෂිපින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
හේමාස් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

05-28

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සොලිටෙයාර් සොලුෂන්ස් (පුද්ගලික) සමාගම
සංස්ථාගත අංකය : පී වී 85380
සංස්ථාගත කළ දිනය : 2012.04.05
ලියාපදිංචි කාර්යාලය : අංක 95 ඒ, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.

අධ්‍යක්ෂ.

05-39

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර සහීරා ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම 2012 පෙබරවාරි මස 28 දා සංස්ථාපිත කළ බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 84590
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 33, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

අධ්‍යක්ෂ.

05-42

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කරන ලද බවට කරනු ලබන නිවේදනයයි:-

සමාගමේ නම : ඔනෙල්ගෝ (ප්‍රයිවට්) ලිමිටඩ්

ලියාපදිංචි අංකය : පී වී 85043

සංස්ථාගත කළ දිනය : 2012.03.21

ලියාපදිංචි ලිපිනය : අංක 393 බී, පරණ කොට්ටාව පාර, උඩහමුල්ල, නුගේගොඩ.

එස්. එන්. ජයසූරිය,
සමාගම් ලේකම්.

05-41

## දැන්වීමයි

2011 ජුනි මස 16 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි සමාගම් නාමය වෙනස් කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පෙර නාමය : ලංකා ලෙෂර් රිසෝට්ස් ඇන්ට් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ නව නාමය : ලංකා ලෙෂර් රිසෝට්ස් හෝල්ඩිංන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් අංකය : පී වී 2917

ලියාපදිංචි කාර්යාලය : අංක 154, ගාලු පාර, කොළඹ 04.

අරුණි සැන්ඩර්ස්,
සමාගම් ලේකම්.

අංක 111, කිරුළපන ඇවනියු,
කොළඹ 05,
දුරකථන අංකය : 4866840.

05-45

## ප්‍රසිද්ධ දැන්වීමයි

පහත සඳහන් වගකීමෙන් සීමිත සමාගම් 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ:-

| *සමාගමේ නම* | *පී වී අංකය* | *ලියාපදිංචි කළ කාර්යාලය* |
|---|---|---|
| එම්. පී. මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 84294 | සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| චායි ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 84848 | එම |
| ටී වන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 84746 | එම |
| ඒ ආර් ජේ ටී හෝල්ඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 84936 | එම |
| සෙන්ටර් ෆෝ ඔකියුපේෂනල් සේෆ්ටි ඇන්ඩ් හෙල්ත් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 84736 | අංක 22, සල්මල් මාවත, නැදිමාල, දෙහිවල |
| ආර් ජේ ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 84622 | ලෙවල් 6, ඇක්සස් ටවර්ස්, අංක 278, යූනියන් පෙදෙස, කොළඹ 02. |

සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 10, හැව්ලොක් පෙදෙස,
කොළඹ 05.

05-40

## විශේෂ ඇටර්නි බලකරය අවලංගු කිරීම

ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් ශ්‍රී ලංකාවාසී මහජනතාවටත් දන්වා ප්‍රකාශ කර සිටින්නේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල, කපුවත්ත, අංක 115/3 හි පදිංචිව සිටි දැනට මහනුවර, කුළුගම්මන පදිංචි අබේනායකගේ දීපානී අබේනායක (ජාතික හැඳුනුම්පත් අංක 617780020 V) වන මම, වර්ෂ 2009ක් වූ මාර්තු මස 09 වැනි දින මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ජී. මුණසිංහ මහත්මිය විසින් සහතික කරන ලද අංක 8202 දරන අවලංගු කළ නොහැකි විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් මා විසින් මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල, කපුවත්ත, අංක 115/3 හි පදිංචි ප්‍රදීප් ද සොයිසා සිරිවර්ධන (ජාතික හැඳුනුම්පත් අංක 652692893 V) යන අයට පවරන ලද ඇටෝර්නි බලය අවලංගු කර බලරහිත කරන ලද බවයි.

මින් ඉදිරියට මා ගැන හෝ මා වෙනුවෙන් ඉහත නම් සඳහන් ප්‍රදීප් ද සොයිසා සිරිවර්ධන යන අය විසින් ක්‍රියාත්මක කරනු ලබන නීතිමය හෝ වෙන යම් ක්‍රියාවක් පිළිබඳව කිසිම වගකීමක් මා භාර නොගන්නා බව ද මෙයින් ප්‍රකාශ කරමි.

අබේනායකගේ දීපානී අබේනායක.

2012 අප්‍රේල් මස 18 වැනි දින.

05-60/1

## විශේෂ ඇටෝර්නි බලකරය අවලංගු කිරීම

ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් ශ්‍රී ලංකාවාසී මහජනතාවටත් දන්වා ප්‍රකාශ කර සිටින්නේ සිංගප්පූරුව මැන්ඩරින් ගාඩ්න් 15-02 සින්ග්ලැප් - 01 හි පදිංචිව සිටි දැනට මහනුවර, කුළුගම්මන පදිංචි අබේනායකගේ දීපානී අබේනායක (ජාතික හැඳුනුම්පත් අංක 617780020 V) වන මම, වර්ෂ 2008ක් වූ මාර්තු මස 05 වැනි දින සිංගප්පූරුව ශ්‍රී ලංකා තානාපති සාමදාන විනිශ්චයකාර ඒ. සී. එම්. ඉබ්‍රාහිම් මහතා විසින් සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් මා විසින් මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල, කපුවත්ත, අංක 115/3 හි පදිංචි ප්‍රදීප් ද සොයිසා සිරිවර්ධන (ජාතික හැඳුනුම්පත් අංක 652692893 V) යන අයට පවරන ලද ඇටෝර්නි බලය අවලංගු කර බලරහිත කරන ලද බවයි.

මින් ඉදිරියට මා ගැන හෝ මා වෙනුවෙන් ඉහත නම් සඳහන් ප්‍රදීප් ද සොයිසා සිරිවර්ධන යන අය විසින් ක්‍රියාත්මක කරනු ලබන නීතිමය හෝ වෙන යම් ක්‍රියාවක් පිළිබඳව කිසිම වගකීමක් මා භාර නොගන්නා බව ද මෙයින් ප්‍රකාශ කරමි.

අබේනායකගේ දීපානී අබේනායක.

2012 අප්‍රේල් මස 18 වැනි දින.

05-60/2

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනත ප්‍රකාරව සංස්ථාපනය කරන ලද පහත සමාගම පිළිබඳව තොරතුරු එම පනතේ වගන්ති අංක 9 උපවගන්ති 1 නියමයන්ට අනුකූලව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ජේ. බී. ටී. වර්ල්ඩ් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 85467
ලියාපදිංචි දිනය : 2012 අප්‍රේල් මස 10
ලියාපදිංචි ලිපිනය : අංක 150, ශාන්ත ජෝශප් වීදිය, කොළඹ 14.

සමාගම් ලේකම්.

05-59

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු :-

ලියාපදිංචි සමාගමේ නම : ඒ. එම්. සී. එස්. ඇග්‍රී සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 85367
ලියාපදිංචි කළ දිනය : 2012.04.04
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 453/1, හැව්ලොක් පාර, කොළඹ 06.
(වරලත් ගණකාධිකාරි කාර්යාලයේ ලිපිනය)

ෆයිනැන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-75

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත, කොට්ටල, මහින්ද සෙවන පදිංචිව සිටි දැනට ඇමරිකා එක්සත් ජනපදයේ වී. ඒ. 22124 ඔක්ටන් වේල් පාර අංක 1200 4 හි පදිංචි ගාර්දිය වසම් බදුගේ අනෝමා ද සිල්වා රවුස් වන මම, වර්ෂ 1995ක් වූ නොවැම්බර් මස 06 වැනි දින මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එල්. එම්. අනීස් මහතා විසින් ලියා සහතික කරන ලද අංක 1663 දරන ඇටෝර්නි බලකරය මත හඟුරන්කෙත, කොට්ටල, මහින්ද සෙවන පදිංචි ගර්දිය වසම් බදුගේ සුමනා ද සිල්වා වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙයින් අවලංගු කර අහෝසි කරන බවත් මින් මතු එකී ඇටෝර්නි බලය කිසිදු නීත්‍යානුකූල බලපත්‍රයක් නොවන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මෙයින් දැනුම් දෙමි.

05-114

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සමාගම සංස්ථාගත කළ බව මෙයින් නිවේදනය කරන්නෙමු :-

සමාගමේ නම : රන් ක්‍රිස්ප් මාර්කටින් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලි. ප. අංකය : පී වී 76106
සංස්ථාගත කළ දිනය : 2010 දෙසැම්බර් 17 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 41/3 ඒ, අගරදගුරු මාවත, තුඩැල්ල, ජාඇල.

අධ්‍යක්ෂ.

05-113

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 දරන වගන්තිය ප්‍රකාරව ග්‍රාෂියා ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වර්ෂ 2012ක් වූ අප්‍රේල් මස 05 වැනි දින සංස්ථාපනය කරන ලද බවට කරනු ලබන දැනුම් දීමයි.

සමාගමේ නම : ග්‍රාෂියා ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 85411
ලියාපදිංචි කාර්යාලය : අංක 66, ග්‍රෑන්ඩ් හොටෙල් මාවත, නුවරඑළිය.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

සමාගම් ලේකම්.

05-102

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 දරන වගන්තිය ප්‍රකාරව ශක්ති රියල් එස්ටේට් (ප්‍රයිවට්) ලිමිටඩ් වර්ෂ 2012ක් වූ මාර්තු මස 01 වැනි දින සංස්ථාපනය කරන ලද බවට කරනු ලබන දැනුම් දීමයි.

සමාගමේ නම : ශක්ති රියල් එස්ටේට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 84632
ලියාපදිංචි කාර්යාලය : අංක 20, උසාවි පාර, හලාවත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

සමාගම් ලේකම්.

05-101

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ටී වුඩ් ෆ්ලෝරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 74210
සංස්ථාගත කළ දිනය : 2010.09.08
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 28, ජෝශප් පටුමග, කොළඹ 04.

රංජිනි මෙන්ඩිස්,
සමාගම් ලේකම්.

අංක 68/1, තලපත්පිටිය පාර,
උඩහමුල්ල,
නුගේගොඩ.

05-105

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

බම්බලපිටිය තට්ටු නිවාස, එල් කොටස තුන් වැනි මහල, අංක 9 හි පදිංචි හා දැනට රැකියාව සඳහා ඇමෙරිකාවේ පදිංචිව සිටින කුරුකුලසූරිය මෙරෙන්ජිරාලලාගේ සුනිල් ජෝසප් ප්‍රනාන්දු වන මම, නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් උපුල් වික්‍රමනායක විසින් සහතික කළ අංක 46 හා 2001 ක් වූ අප්‍රේල් මස 11 වැනි දින යුත් ඇටෝර්නි බලපත්‍රය මගින් මගේ ඇටෝර්නි බලකාරයා වශයෙන් පත්කරන ලද කුරුණෑගල, පුත්තලම පාරේ, අංක 291 දරන ස්ථානයේ පදිංචි, කුරුකුලසූරිය මෙරෙන්ජිරාලලාගේ හර්මන් ඇන්සලම් ප්‍රනාන්දු මහතාගේ ඇටෝර්නි බලය වර්ෂ 2012ක් වූ පෙබරවාරි මස 28 වැනි දින සිට අවලංගු කර ඇති බව ශ්‍රී ලංකාවාසී ජනතාවට සහ ජනරජයට මෙසේ දැනුම් දෙමි.

මින් ඉදිරියට ඔහු සමග සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවකට මා බැඳී නැති බව ද දැනුම් දෙමි.

05-98

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ, 9(1) වගන්තියට අනුගාමීව 2012 මාර්තු 24 වැනි දින සී/ස කාල්ටන් ඉන්ටනැෂනල් (පුද්ගලික) සමාගම, සංස්ථාපනය කළ බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සී/ස කාල්ටන් ඉන්ටනැෂනල් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 84913
ලියාපදිංචි කාර්යාලය : අංක 15-4/2, කැනල් ලේන්, කොළඹ 06.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

වීරප්පන් සිවගුරුණාදන්,
ලේකම්.

05-86

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ, 9(1) වගන්තියට අනුගාමීව 2012 මාර්තු 16 වැනි දින සී/ස සී එම් ජේ ඉන්ටනැෂනල් (පුද්ගලික) සමාගම, සංස්ථාපනය කළ බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සී/ස සී. එම්. ජේ. ඉන්ටනැෂනල් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 83975
ලියාපදිංචි කාර්යාලය : අංක 278/3, කොලොන්නාව පාර, වැල්ලම්පිටිය.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

වීරප්පන් සිවගුරුණාදන්,
ලේකම්.

05-87

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීමයි

මහරගම, ගොඩිගමුව, ශ්‍රී සද්ධර්මාරාම පාර, අංක 58/14සී 1 දරන තැන පදිංචි තන්ත්‍රිවත්තගේ දෝන චන්ද්‍රාවතී මල්කාන්ති වන මම, ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඩී. පෙරේරා මහතා සහතික කළ අංක 3377 සහ 2009.08.29 දින දරන ඇටෝර්නි බලය මගින් මහරගම, ගොඩිගමුව, නීලම්මහර පාර, වීදිය බණ්ඩාර පෙදෙස, අංක 21/1ඒ දරන ස්ථානයේ පදිංචි තන්ත්‍රිවත්තගේ දොන් සුදත් වසන්ත කුමාර වෙත පවරන ලද බලය වර්ෂ 2012 මාර්තු මස 25 වැනි දින සිට අවලංගු කරන ලද බවත්, එදිනට පසු ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය සහ මහජනතාව වෙත මින් දන්වා සිටිමි.

ටී. ඩී. සී. මල්කාන්ති.

05-80

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

HNB 148 -12.

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - තලංගම ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2004.04.01 වැනි දින අංක 1076 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද, පිළිවෙළින් 2005.06.07 දින අංක 2762 සහ 2005.11.10 දින අංක 2907 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2007.12.12 දින අංක 3034 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද, 2008.02.11 දින අංක 2047 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හරිස්චන්ද්‍ර ගන්හේවා සහ අනෝජා ජානකී ගන්හේවා විවාහයට පෙර පෙරේරා යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරු ගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල්, අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2012 ක් වූ ජුනි මස 20 වැනි දින පෙ.ව. 9.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ .-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ මහරගම, නගර සභා සීමාව තුළ තලවතුගොඩ පිහිටි මොරගහවත්ත හෙවත් දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එන්. එස්. ලක්ෂණ විසින් මැන සාදන ලද 1992.01.03 දින අංක 24 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් තිස් එකයි දශම එකයි දශම පහක් (අ. 0, රූ.0, පර්. 31.15)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2012.01.13 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ 2012.03.02 දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.-* කොළඹ කොටුවේ සිට බොරැල්ල හරහා බත්තරමුල්ලට සැතපුම් 6 ක් ගමන් කොට, එතැනින් පන්නිපිටිය පාරේ තලවතුගොඩ කඩමණ්ඩිය පසුකොට කිලෝමීටරයක් නොහොත් බත්තරමුල්ල සිට සැතපුම් 3 ක් දුර ගෙවා කලල්ගොඩ පාරට යාර 25 ක් මෙපිටින්, දකුණට හැරී ප්‍රධාන පාරේ සිට යාර 100 ක් ගිය තැන කෙළවර අඩි 15 ක් පළල පොදු පාරේ අවසන මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-*වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :-

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක්ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු සහ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. (දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනමට සාම විනිසුරු),
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13, උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංකය : 0777-378441,
0714-424478,
ෆැක්ස් අංකය : 0112-345975.

05-81

---

## පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2012 මැයි මස 25 වැනි දින පෙ.ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, පිටකෝට්ටේ, කෝට්ටේ පාරේ වරිපනම් අංක 326 දරන දැනට ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමාව තුළ පිටකෝට්ටේ (කොට්ඨාස අංක 6) හි පිහිටි දැනට ශාන්ත තෝමස් දේවස්ථාන පරිශ්‍රය නමින් හැඳින්වෙන මදටියගහවත්ත නොහොත් මාරගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ජේ. ජී. කම්මානන්කඩ විසින් මැන සාදන ලද අංක 2959 සහ 2004 මාර්තු 21 දිනැති සැලැස්මෙහි ලොට් 7 වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති ඉඩම සහ එය තුළ පිහිටි ගොඩනැගිලි, වැව්ලි ආදී සියලු දේත් වේ.
(අ. 0, රූ. 0, පර්. 11.87)

අයි. සී. එම්. මයික්‍රෝ කොම්පියුටර් සිස්ටම්ස් (ප්‍රයිවට්) විසින්, කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුන ලියාපදිංචි අංක පී. කිව් 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රී විසින් සහතික කරන ලද අංක 626 සහ 2004 පෙබරවාරි 27, අංක 1003 සහ 2006 ජුනි 21 සහ අංක 1496 සහ 2008 මාර්තු 31 දින දරන උකස්කරයන් සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් චම්පා හපුහින්න විසින් සහතික කරන ලද අංක 270 දරන සහ 2011 ජුනි මස 10 වැනි දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය.*- සඳහා 2012.04.20 දිනැති ඩේලි නිව්ස්, ලක්බිම, සුඩර්ඔලි පුවත්පත් සහ 2012.04.20 වැනි දින *ගැසට් පත්* ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.*- පිටකෝට්ටේ හන්දියේ සිට පිටකෝට්ටේ පාර දිගේ මිරිහාන දෙසට මීටර් 175 ක් පමණ ගිය විට ශාන්ත තෝමස් විද්‍යාලය අසල පාරෙහි වම්පස විකිණීමට නියමිත ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැනුම් මුදලේ 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 500 ද,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු ජොෂ්ඨ කළමණාකරු නීති, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී, ප්‍රධාන කාර්යාලය, අංක 450 ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංක : 2565573.

පී. කේ. ඒ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011-2873656, 0777-672082,
ෆැක්ස් අංකය : 011-2871184.

05-85

---

**මහජන බැංකුව - ගාල්ල මහවීදිය ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2012.05.18 වැනි දින පෙ.ව. 10.30 ට මෙහි පහත විස්තර වන දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර.*- දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙපත්තුවේ මීපේ පිහිටි සෙන්ට්‍රල් පාර්ක් නමැති ඉඩමේ බෙදාවෙන් කළ අංක 74 දරන පර්චස් දහයයි දශම හතයි එකක් (අ. 0, රූඩ් 0, පර්. 10.71) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේද වේ. මෙම ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කේ. සිරිවර්ධන මහතා විසින් සකස් කරන ලද 348/2003 හා 2003.06.15 වැනි දින දරන පිඹුරේ සහ එකී මිනින්දෝරු මහතා විසින් මෑතකදී සකස් කරන ලද අංක 817/2005 හා 2002.12.02 වැනි දින පිඹුරේ ද මෙම දේපළ පිළිබඳ සඳහන් කර ඇත.

වැඩි විස්තර සඳහා 2009.05.22 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2009.08.14 වැනි දින දිනමිණ, ඩේලිනිවුස් සහ තිනකරන් යන පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීමේ මාර්ගය.*- ගාල්ල මාතර ප්‍රධාන මාර්ගයේ හබරාදූව නගරයෙන් වම් පසට ඇති දික්කුඹුර පාරේ කි. මී. 02 ක් පමණ ගමන් කළ විට වම් පසට වැටී ඇති ශ්‍රී ආරියවංශ මාවතේ මීටර් 600 ක් පමණ ගමන් කළ විට දකුණට වැටී ඇති සෙන්ට්‍රල් පාර්ක් වෙන්දේසි ඉඩම පාරේ මීටර් 200 ක් පමණ ගමන් කළ විට පාරේ වම්පස පාරට මුහුණලා මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

01. ගැණුම් මිලෙන් 10% ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1% ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත ගාල්ල පහළ ඩික්සන් පාරේ අංක 22 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංකය : 091-2232311, 2234785, 2234171, 2223564
ෆැක්ස් අංකය : 091-2232230

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද(සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර,
දුරකථන අංකය : 041-2228731, 071-4438516.

05-66

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කොට්ටාව ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පී එල් සී නමට ලියන ලද්දා වූ ද, 2010.06.29 දිනැති සහ අංක 5875 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම කපිල අසන්ත කුමාරසිරි මාතරගේ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරු ගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2012 ක් වූ ජූනි මස 20 වැනි දින පෙ.ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ .-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ හෝමාගම කීනගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් මැන සාදන ලද 1961.06.28 වැනි දිනැති අංක 680 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 22 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි සහ සියලු දේත් වේ. විශාලත්වය පර්චස් 20.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.08.19 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.08.16 වැනි දින ලක්බිම, ඩේලිමිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.-* හෝමාගම නගරයේ සිට අවිස්සාවේල්ල පාරේ, සම්පත් බැංකුව දක්වා මීටර් 100 ක් පමණ ගොස් එතැනින් වමට හැරී, මීටර් 50 ක් පමණ පළමු පටුමගේ ගමන් කළ විට දේපළට ළඟාවිය හැක. එය මේ පාරේ දකුණත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-*වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැංක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුලත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු සහ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂක සහ අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13,
උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංකය : 0777-378441,
0714-424478,
ෆැක්ස් අංකය : 0112-345975.

05-82

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය … … … … … … … | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස … … … … … … … … | 580 00 | 3,120 00 |
| III වැනි කොටස … … … … … … … … | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 890 00 | 2,400 00 |
| V වැනි කොටස … … … … … … … … | 860 00 | 420 00 |
| VI වැනි කොටස … … … … … … … … | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය… … … … … … … … | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … … | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 25 00 | 60 00 |
| III වැනි ඡේදය … … … … … … … … | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 80 00 | 120 00 |
| II වැනි කොටස … … … … … … … … | 12 00 | 60 00 |
| III වැනි කොටස … … … … … … … … | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 23 00 | 60 00 |
| V වැනි කොටස … … … … … … … … | 123 00 | 60 00 |
| VI වැනි කොටස … … … … … … … … | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. *ඊළඟ ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2012** | | | |
| මැයි | 2012.05.04 | සිකුරාදා | 2012.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.11 | සිකුරාදා | 2012.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.18 | සිකුරාදා | 2012.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.25 | සිකුරාදා | 2012.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2012.06.01 | සිකුරාදා | 2012.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.08 | සිකුරාදා | 2012.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.15 | සිකුරාදා | 2012.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.22 | සිකුරාදා | 2012.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.29 | සිකුරාදා | 2012.06.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2012.07.06 | සිකුරාදා | 2012.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.13 | සිකුරාදා | 2012.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.20 | සිකුරාදා | 2012.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.27 | සිකුරාදා | 2012.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.